# හැඳින්වීම

සාමාන්‍ය ව්‍යවහාරයේ මෙන් ම ඉතා පුළුල් විද්‍යාත්මක අධ්‍යයනවලින් ද අර්ථ නිරූපණය කරන අන්දමට ' චිත්තවේග' යනු විශේෂිත ලෙස වෙන් කොට දැක්විය හැකි ප්‍රපංචයකි. මෙවැනි සුවිශේෂ වෙනස්කමක් විශේෂයෙන් කැපී පෙනෙන්නේ

1. චිත්තවේග ජනනය
2. චිත්තවේග වේදනය හෙවත් අනුභූතිය
3. චිත්තවේග ප්‍රකාශනය
4. චිත්තවේගික චර්යාව

යන ක්‍රියාවලි තුළ දක්නට ලැබෙන විශිෂ්ටතාව පදනම් කර ගෙන යි. මේ අතින් චින්තනය, ස්මෘතිය, සංජානනය හා භාෂණය වැනි උසස් ස්නායු ක්‍රියාකාරිත්ව හෙවත් උසස් මානසික ප්‍රපංච මෙන් ම ඉන්ද්‍රිය සංවේදනය, කායික විද්‍යාත්මක ප්‍රේරණ, වේදන හා ආවේදන වැනි ස්නායු කායික ක්‍රියාකාරිත්වවලින් ද චිත්තවේග වෙනස් වෙයි. මිනිසා සම්බන්ධයෙන් ගත් විට මානව පරිනාමයේ පටන් සමකාලීන සමාජ ජීවිතය දක්වා වූ විස්තීර්ණ ක්‍රියාදාමයේ සෑම අංශයක් සමඟ ම ආසන්න ලෙස බැඳී පවතින ගාමක බල වේගයක් හා චර්යා පද්ධතියක් වශයෙන් චිත්තවේගවලට හිමි වන ස්ථානය අනෙක් ඕනෑ ම මනෝ විද්‍යාත්මක ප්‍රපංචයක් හිමි කර ගන්නා ස්ථානයට වඩා වෙනස් වන්නකි. මේ හේතුව නිසා යුහද කතා බහක සිට රාජ්‍ය පරිපාලනය වැනි වූ ඕනෑ ම ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක දී කිසි සේත් නො තකා හැරිය නො හැකි සාධකයක් ලෙස චිත්තවේග මිනිස් ජීවිතය හාත්පස පැතිරී පවතී. මිනිසාගේ බුද්ධිමය සහ සමාජ ජීවිතයේ සෑම අංශයක් තුළ ම චිත්තවේග තීරණාත්මක කාර්ය කොටසක් ඉටු කරයි.

එහෙත් සාම්ප්‍රදායික දර්ශනයේ සහ මනෝ විද්‍යාවේ ආරම්භක අවධියේ චිත්තවේග තේරුම් කෙරුණේ යම් අභ්‍යන්තරික විඥානික භූතාර්ථයක් වශයෙනි. එය පුද්ගල විඥානයේ හෝ මනසේ ' ක්ෂණික දීප්තියක්' හෝ ' කැළඹීමක්' ලෙස වටහා ගැනීමට උත්සාහ දැරිණි. නමුත් මෙම අර්ථ කථනයෙන් චිත්තවේගී ක්‍රියාවලිය පැහැදිලි නො වුණා පමණක් නොව තව දුරටත් ව්‍යාකූල විය. මනෝ විද්‍යාව ස්වාධීන විද්‍යාවක් වශයෙන් ඉදිරියට ඒමත් සමග ම මෙම ව්‍යාකූලත්වය ක්‍රමයෙන් පහ වී ගොස්

රුහුණ විශ්ව විද්‍යා

වඩාත් පුළුල් හා පැතුරුණු ප්‍රවේශයක් චිත්තවේග අධ්‍යයනවලට ලැබීම හේතු කොට ගෙන වෙනත් විධියක විෂය මූල ගැටලු චිත්තවේග සම්බන්ධයෙන් ඉස්මතු විය. ඒ අනුව චිත්තවේගවල විශේෂත්වය කුමක් ද? චිත්තවේග, නිර්චිත්තවේගික තත්වයෙන් වෙන් කොට දැක්විය හැකි ද? චිත්තවේග වෙන් වෙන්ව හඳුනා ගත හැකි ද? චිත්තවේග ජනක අවස්ථා මොනවා ද? චිත්තවේගවලින් කෙරෙන කාර්යය කුමක් ද? ආදි ගැටලු ආනුභවික අධ්‍යයන ක්‍රම ඇසුරෙන් හැදෑරීමේ උනන්දුවක් පසු ගිය දශක කීපය තුළ දක්නට ලැබුණි. මෙම අධ්‍යයනවලින් චිත්තවේග පිළිබඳ මනෝ විද්‍යාවට,

1. වාද, උපන්‍යාස සහ දත්තවලින් යුත් පුළුල් විෂය ක්ෂේත්‍රයක්
2. ප්‍රමාණවත් තරමේ විධික්‍රමයක්

සකස් වී ඇත.

එහෙත් මෙම ක්ෂේත්‍රය තුළ තව මත් නො විසඳී ඇති පළමු හා දෙ වන මට්ටමේ මූලික ගැටලු ඇති අතර නව ගැටලු මතු වෙමින් පවතී. ඉන් බොහෝ පර්යේෂණ තුළ දක්නට ලැබෙන ඉතා මූලික ගැටලුවක් වන්නේ, 'චිත්තවේග විස්තර කිරීමේ දී කායික විද්‍යාත්මක සාධකවලට හිමි වන ස්ථානය කුමක් ද?' යන්න යි. චිත්තවේග අධ්‍යයන තුළ විවිධ ප්‍රවේශ අතර ඇති වෙනස්කම්වලට සහ මත භේද වලට තුඩු දී ඇති මෙම ගැටලුව ඒ නිසා ම තීරණාත්මක හා විෂය මූලික ගැටලුවක් ද වෙයි. අනෙත් අතට එය දාර්ශනික මනෝ විද්‍යාවේ මූලික ගැටලුව වන 'කාය –චිත්ත ගැටලුව' සමග ද සමීප ලෙස බැඳී පවතී. මෙම අධ්‍යයනයට තුඩු දී ඇත්තේ මෙම විශේෂිත ගැටලුව යි.

මෙම ගැටලුව අධ්‍යයනය කිරීමේ දී ක්ෂේත්‍රය පිළිබඳ ඇති විවිධ සීමා සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ප්‍රධාන ගැටලු දෙක නිරාකරණය කිරීමට උත්සාහ ගනු ලැබේ.

1. චිත්තවේග ස්නායු–කායික විද්‍යා යාන්ත්‍රණයක් වශයෙන් කොතෙක් දුරට පැහැදිලි කළ හැකි ද?
2. එසේ නො හැකි නම්, එවැනි ස්නායු–කායික විද්‍යාත්මක පැහැදිලි

කිරීමත දී ඉතිරි වන 'හිඩැස' , චිත්තවේග ජනක අවස්ථා සහ ආවේදන විනිශ්චය කෙරෙන පෞද්ගලික විවිධතාවලට පාදක වන " ඇගයුම්ශීලී ආකල්ප" නැමැති සාධකයට පුරවා ලිය හැකි ද?

මෙහි දී පළමුව ' චිත්තවේග' නැමැති සංකල්පයේ විෂය සීමාව සහ විවිධ අධ්‍යයනවලට මුල් වී ඇති ගැටලු හඳුනා ගැනීමත් එම ගැටලු නිරාකරණයේ දී කායික විද්‍යාත්මක අධ්‍යයනවලින් ලැබෙන පිටිවහලත් සැලකිල්ලට යොමු කෙරේ. චිත්ත වේග පිළිබඳ කායික විද්‍යාත්මක වාද සහ ආනුභවික සම්පරීක්ෂණවල ප්‍රතිඵල සමාලෝචනය කිරීම මගින් යම් තර්කානුකූල ඒකගතාවක් ගොඩ නගා ගැනීමට උත්සාහ ගැනේ. අනතුරුව චිත්තවේග අධ්‍යයනවල දී මනෝ විද්‍යාඥයන් විසින් සලකා බලා ඇති ප්‍රජානන ක්‍රියාකාරිත්වය විමසිල්ලට භාජන කෙරේ. විශේෂයෙන් ප්‍රජානනය සහ අභිප්‍රේරණය චිත්තවේග අධ්‍යයනයේ දී දැඩි අවධානයට යොමු වී ඇති සංකල්ප දෙකකි. මෙම සංකල්ප වෙන වෙන ම ගත් කල ඊට විශේෂිත අර්ථ දැක්වීමත් නූතන මනෝ විද්‍යාව තුළ දක්නට ඇතත් චිත්තවේග හා ඒවායේ ඇති සම්බන්ධය තුළ යම් විශේෂ අර්ථයක් ලබා දිය හැකි බව පෙනී යනු ඇත. පුද්ගලයා සහ පරිසරය අතර සම්බන්ධතා වටහා ගැනීමේ දී ඇගයීම සහ ආකල්පය මුල් කර ගත් ක්‍රියාකාරිත්වයක් චිත්තවේග වල ඇති බව නිගමනය කිරීමට මෙම ප්‍රජානනික අධ්‍යයන ඉවහල් කර ගත හැකි ය. මෙයින් කායික විද්‍යාත්මක සාධක සහ මනෝ විද්‍යාත්මක සාධක අතර ඒකාබද්ධතාවක් චිත්තවේග අධ්‍යයනයේ දී පැවතිය යුතු යයි යෝජනා කළ හැකි වේ.

මෙම ඒකාබද්ධතාව චිත්තවේග අධ්‍යයනවල දී කැපී පෙනෙන මූලික දාර්ශනික ප්‍රවණතා දෙක අතර යම් ගැළපීමක් ඇති කරයි. නූතන දාර්ශනික මනෝ විද්‍යාවේ මූලික ගැටලුව වන කාය-චිත්ත ගැටලුව විමර්ශනය කිරීමේ දී චිත්තවේග අධ්‍යයනවල අදාළ බව රැඳා පවතින්නේ මේ හේතුව නිස යි. එක් අතකින් බෙහෙවින් යාන්ත්‍රික වූ කායික විද්‍යාත්මක අර්ථ කථනයක සිට අනෙක් අතින් බෙහෙවින් ආත්මීය වූ මනෝ විද්‍යාත්මක අර්ථ කථනයක් දක්වා විහිදී ඇති චිත්තවේග පිළිබඳ අධ්‍යයන කායික - මානසික ඒකාබද්ධතාව පිළිබඳ මූලධර්මය යටතේ ඉදිරියට නො යන්නේ නම් බරපතළ දාර්ශනික ගැටලු මතු කරනු ඇත. මෙතෙක් කෙරී ඇති සියලු

ආනුභවික අධ්‍යයන සහ චිත්තවේග වාද දාර්ශනික පදනමකින් නැවත සලකා බැලීමේ වැදගත්කම සහ අවශ්‍යතාව දාර්ශනිකයාට මෙන් ම මනෝ විද්‍යාඥයාට ද එක සේ වැදගත් වන්නේ මෙහි දී ය. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ මෙම අවශ්‍යතාව යම් පමණකින් හෝ සපුරා ලීමට උත්සාහ දැරීම යි.

කායික විද්‍යාත්මක ප්‍රබෝධනය සහ ප්‍රජානනික ක්‍රියාවලියක ඒකාබද්ධතාව ඇසුරෙන් චිත්තවේගවලට නව අර්ථ නිරූපණයක් ලබා දීමට තෙරෙන මෙම උත්සාහය සාම්ප්‍රදායික දර්ශනයේ චිත්තවේග පිළිබඳ ඉගැන්වීම නැවත ඇගයීමට අවශ්‍ය නව ප්‍රවේශයක් ලබා දෙයි. අනෙක් අතට කායික විද්‍යාව සහ මනෝ විද්‍යාව අතරත් ඒවා සහ දර්ශනය අතරත් ඇති සමීප සම්බන්ධය එයින් තහවුරු කෙරෙයි. මෙසේ නූතන දාර්ශනික මනෝ විද්‍යාවේ නව උපනතියක් මේ අධ්‍යයනය හරහා දිව යයි. එනම්: කය සහ මනස අතර ඒකාබද්ධතාවත් එහි විකාසනයේ දී වංශ ප්‍රවේණිය සහ ව්‍යක්ති ප්‍රවේණිය අතර ඒකාබද්ධතාවත් එහි ක්‍රියා කාරිත්වයේ දී මිනිසා සහ පරිසරය අතර අන්තර් ක්‍රියාකාරිත්වයත් චිත්තවේග අධ්‍යයනවල දී මුල් කර ගත යුතු දාර්ශනික උප නතිය වන්නේ ය යන්න යි.